# උපදෙස් පත්‍රිකාව

මාර්ගස්ථ ක්‍රමය යටතේ පමණක් පොලිස් නිශ්කාසන අයදුම්පත් යොමු කල යුතු අතර ඒ සඳහා මාර්ගස්ථ නිශ්කාසන අයදුම් කිරීමේ ක්‍රමය (Online) ඔස්සේ නිශ්කාසන අයදුම්පත යොමු කිරීමේ හැකියාව ඇති අතර ඒ සඳහා මුදල් ගෙවීම Credit card මඟින් හා Debit card මඟින් සිදු කල හැකිය. ( www.police.gov.lk)

මෙම නිෂ්කාසන අයදුම්පත්‍රයේ ප්‍රශ්න සඳහා තොරතුරු ඇතුලත් කිරීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න. අයදුම්පත සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ( විද්‍යුත් තැපැල් ලිපිනය හැර ) සම්පූර්ණ කරන්න . (EG :- BANDARA)

පොලිස් නිෂ්කාසන සහතිකයක් අයදුම් කිරිමේදි අයදුම්පතෙහි පළමු ප්‍රශ්නය Application type යනුවෙන් සදහන් කර ඇත.

- එහිදි අයදුම්කරුට “New” සහ “Renewal” ලෙස විකල්ප දෙකක් ලබා දී ඇත.

- ප්‍රථම වතාවට ශ්‍රී ලංකා පොලිස් නිෂ්කාසන සහතිකයක් අයදුම් කරන අවස්ථාවේදි, කලින් අයදුම්කර නිවැරදි තොරතුරු ඇතුලත් නොකිරිම හේතුවෙන් දෝෂ සහිත සහතික පතක් ලද අවස්ථාවක (උදා - ජාතික හැදුනුම්පත් අංකය වෙනුවට විදේශ ගමන් බලපත් අංකය ඇතුලත් කිරිමට, ජාතික හැදුනුම්පතෙහි නම වෙනුවට විදේශ ගමන් බලපත්‍රයේ නම ඇතුලත් කර ගැනිමට, වර්ථමාන ලිපිනය වෙනස් කර ගැනිමට, සහතිකපත නිකුත් කර ඇති කාලසීමාව දීර්ඝ කර ගැනීමට හෝ යම් කාලසීමාවක් ඉවත් කර ගැනීමට, නව ජාතික හැදුනුම්පත් අංකය හෝ නව විදේශ ගමන් බලපත්‍ර අංකය ඇතුලත් කර ගැනිමට, ජාතික හැදුනුම්පතෙහි හෝ විදේශ ගමන් බලපත්‍රයේ නම, ලිපිනය හෝ වෙනත් තොරතුරු සංශෝධනය කරගත් අවස්ථාවක එම තොරතුරු ඇතුලත් කර ගැනීමට) යන අවස්ථා වලදි “New” විකල්පය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

- “Renewal” යන විකල්පය තෝරාගත් විට වසරක් ඇතුලත අවසන් වරට ලබාගත් සහතික පතක පිටපතක් පමණක් ලබාගත හැකි අතර එම අයදුම්පතෙහි තානාපති ලිපිනය හැර වෙනත් කිසිදු වෙනස් කමක් සිදු කිරිමට නොහැක.

ජාතික හැදුනුම්පතෙහි සහ විදෙස්ගමන් බලපත්‍රයෙහි සදහන් නම් ඒ ආකාරයෙන්ම සදහන් කල යුතුය. (ඉංග්‍රිසි අකුරු ඒ ආකාරයෙන්ම නිවැරදිව ඇතුලත් කිරිමට වග බලාගත යුතුය)

Which name Should be printed in certificate යනුවෙන් සදහන් කර ඇති ප්‍රශ්නය සදහා "NIC" සහ "passport" යනුවෙන් විකල්ප දෙකක් ලබා දී ඇත.

- "NIC" යන විකල්පය තෝරාගත් විට සහතික පතෙහි මුද්‍රණය වන්නේ ජාතික හැදුනුම්පතෙහි අංකය සහ එහි සදහන් නම වේ.
- "Passport" යන විකල්පය තෝරාගත් විට සහතිකපතෙහි මුද්‍රණය වන්නේ විදේශ ගමන් බලපත්‍ර අංකය සහ එහි සදහන් නම වේ. මෙහිදි අයදුම්කරුගේ විදේශ ගමන් බලපත්‍රයේ නම සහ ජාතික හැදුනුම්පතේ නම අතර වෙනසක් පවතින්නේ නම් පමණක් ඒ සදහා නීතීඥවරයෙකු හෝ සාමදාන විනිසුරු වරයෙකු විසින් සහතික කරන ලද දිවුරුම් ප්‍රකාශයක මුල් පිටපතක් උඩු ගත කල යුතුය. (නම් අතර වෙනසක් නොමැති විට දිවුරුම් ප්‍රකාශය වෙනුවට විදේශ ගමන් බලපත්‍රය ඇතුලත් කිරිම ප්‍රමාණවත්ය)

"Country" යන්නට නිෂ්කාසන සහතිකපත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන තානාපති කාර්යාලය අයත් රට සදහන් කල යුතුය.

විදේශ රටවල තානාපති ලිපිනයට , ආගමන විගමන පාලකවරයාට පමණක් නිෂ්කාසන සහතිකපත නිකුත් කරනු ලබන අතර පුද්ගලික ආයතන සදහා නිෂ්කාසන සහතිකපත් නිකුත් නොකරන අතර දේශීය ආයතන සදහා ප්‍රාදේශීය පොලිස් ස්ථාන මඟින් සහතිකපත ලබා ගැනීමට ක්‍රියා කල යුතුය.

"Places of residence for the period certificate is required" යනුවෙන් සදහන් කර ඇති ප්‍රශ්නය සදහා නිශ්කාසන සහතිකය ලබා ගැනිම සදහා අවශ්‍ය ශ්‍රී ලංකාවේ පදිංචිව සිටි කාලය පමණක් ඇතුලත් කල යුතුය. ( විදේශගතව සිටි කාලය හැර)

- පදිංචි කාල සීමාවන් නිවැරදිව සදහන් කල යුතුය. ( දිනය/ මාසය/ වර්ෂය)
- පදිංචිව සිටි ලිපිනයන් හා පොලිස් වසම් නිවැරදිව සදහන් කල යුතුය.
- නිශ්කාසන සහතිකය ලබා ගැනිම සදහා අවශ්‍ය කාලසිමාව නිවැරදිව වගුවට ඇතුලත් වි තිබේද යන්න තහවුරු කර ගත යුතුයි.

අයදුම්පත්‍රය අයදුම් කිරිමේදි අයදුම්කරු විසින් පහත සදහන් ලේඛණ වල PDF පිටපත් උඩුගත කිරිමට කටයුතු කල යුතුය. (250kb ට අඩු විය යුතුය)

- ජාතික හැදුනුම්පත, (ඉදිරි පස සහ පසු පස)
- වලංගු විදේශ ගමන් බලපත්‍රය, (ජීව දත්ත සහ සියලුම රටවල් පිටු)
- දිවුරුම් ප්‍රකාශය, (නම් අතර වෙනසක් පවතින අවස්ථාවක)

විමර්ශන කටයුතු සදහා අයදුම්කරු සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සදහා ශ්‍රී ලංකාව තුල භාවිතා කරන දුරකථන අංකයක් සදහන් කල යුතු අතර , විදේශිකයින් සහ විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයින් WhatsApp සහිත දුරකථන අංකයක් අංකයක් සදහන් කල යුතුය.

## <u>සැලකිය යුතුයි</u>

I. අයදුම්පත විමර්ශනය කිරීමේ දී ප්‍රාදේශීය පොලිස් වාර්තා නිර්දේශ නොකිරීම හා ජාතික හැඳුනුම්පත සම්බන්ධ ගැටලු ඇතිවුවහොත් විද්‍යුත් තැපැල් මඟින් අයදුම්කරු දැනුවත් කරන බැවින් නිවැරදි විද්‍යුත් තැපැල් ලිපිනයක් සඳහන් කල යුතුය.

II. පොලිස් නිශ්කාසන වාර්තාව ශ්‍රී ලංකා පොලිසිය විසින් ඔබ පිළිබඳව සිදු කරනු ලබන විමර්ශන මඟින් ලබා ගන්නා පසුබිම් වාර්තාව මත පදනම්ව පොලිස් මූලස්ථානයේ මූලස්ථාන පරිපාලන අධ්‍යක්ෂ විසින් නිකුත් කරනු ලබන අතර අයදුම්කරු සඳහන් කර ඇති ලිපිනයට ලියාපදිංචි තැපැල් මඟින් පමණක් යොමු කරන බව කරුණාවෙන් සලකන්න.

III. අයදුම්කරුගේ පුද්ගලික තොරතුරු ඇතුලත් කිරීමේදි "present Address in Sri Lanka" සඳහන්ව ඇති ස්ථානයේ වර්ථමාන ලිපිනය සඳහන් කිරීමේදි ලිපිනය අවසානයේ "Sri Lanka" යනුවෙන් අනිවාර්යෙන් සඳහන් කල යුතුය.

IV. ජාතික හැඳුනුම්පතෙහි "වෙනත් නම් " යටතේ නම ඇතුලත් කර ඇති අවස්ථාවක සහතිකපතට ඇතුලත් විය යුත්තේ කුමන නම ද? එම නම "Applicant's name in full as in the NIC" යනුවෙන් දි ඇති ස්ථානයට ඇතුලත් කල යුතුය.

V. පොලිස්, ත්‍රිවිධ හමුදා , සිවිල් ආරක්ෂක බලකාය, වෙරළ ආරක්ෂක බලකාය යන බලකායන් වල සක්‍රීය සේවයේ සිටින නිළධාරින් හට පොලිස් නිශ්කාසන වාර්තා නිකුත් කරනු ලබන්නේ බලයලත් නිලධාරීන්ගේ ලිඛිත අවසරය මත පමණි.

VI. භාරදෙන ලද අයදුම්පත් සම්බන්ධයෙන් පසුවිපරම් කිරිමට අවශ්‍ය වු විට පහත සඳහන් දුරකතන මඟින් විමසිම් කල හැකිය.

VII. අයදුම්පතෙහි යම් වෙනස්කමක් කිරිමට අවශ්‍ය නම් ඒ සඳහා අයදුම්පත ඉදිරිපත් කර දින දෙකක් ඇතුලත ඉල්ලිම් කල යුතු අතර ඉන් පසු සිදු කරනු ලබන ඉල්ලිම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VIII. නිෂ්කාසන අයදුම්පතෙහි ඇතුලත් කර ඇති වැරදි තොරතුරු හා අසම්පූර්ණව අයදුම්පත් ඉදිරිපත් කර ඇති අවස්ථාවලදි එම අඩුපාඩුකම් නිවැරදි කරන ලෙසට දුරකථන, විද්‍යුත් තැපැල් හෝ වට්ස් ඇප් ( E-MAIL/ WhatsApp) මඟින් දැනුම් දි ඇති විටක එය මාස 03ක් ඇතුලත සම්පූර්ණ නොකල හොත් එම අයදුම්පත ජාලයෙන් ඉවත් කිරිමට කටයුතු කරනු ලැබේ.

IX. අයදුම්පතෙහි පොලිස් වසමේ පදිංචි කාලය නිවැරදි ලෙස සඳහන් නොකරන අවස්ථාවලදි හා පොලිස් විමර්ශන මඟින් පදිංචිව සිටි කාලය අඩු වශයෙන් සඳහන් කර ඇති අවස්ථාවක විද්‍යුත් තැපැල් හෝ වට්ස් ඇප් ( E-MAIL/ WhatsApp) මගින් ඒ පිළිබඳව ඔබව දැනුවත් කරන අතර එවැනි අවස්ථාවලදී ද ඒ සඳහා නිවැරදි තොරතුරු ලබා නොදෙන්නේ නම් පොලිස් ස්ථාන මඟින් නිර්දේශ කරන කාල සීමාවට පමණක් නිශ්කාසන වාර්තා නිකුත් කිරීමට ක්‍රියා කරනු ලැබේ.

**වැදගත් :**

- නිශ්කාසන සහතිකපතක් සඳහා අයදුම් කිරීමට ලබා දි ඇති කාලය විනාඩි 20 ක් බැවින් විනාඩි 20 ක කාලයක් තුල අයදුම්පත සම්පූර්ණ කර මුදල් ගෙවා අවසන් කල යුතුය.
- විදේශ ගමන් බලපත්‍රයෙහි නම වෙනස් කර ඇත්නම් වෙනස් කිරීමේ පිටුවෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කිරිමට කටයුතු කල යුතුය.
- පැහැදිලි හා වලංගු ජාතික හැඳුනුම්පත් හා විදේශ ගමන් බලපත් යොමු කර නොමැති විට නැවත ගෙවීමකින් තොරව අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ඉහත සඳහන් කරුණු නිවැරදිව ඇතුලත් කිරීම මඟින් නිෂ්කාසන වාර්තාව නිකුත් කිරීම කාර්යාලීය දින 14ක් ඇතුලත සිදු කිරීමට උපකාරි වනු ඇත.

දුරකථන අංක - 0112439185, 0112421111
ෆැක්ස් අංක - 0112439187
වට්ස් ඇප් අංක - 071 8592990
ඊමේල් - clearance@police.gov.lk
වෙබ් ලිපිනය - www.police.gov.lk